සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# සිසු සවිය 2022

## 05 වන ශ්‍රේණියේ දූ පුතුන්ට අත්වැලක්

5

**පස්වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය**
**සබරගමු පළාත**

## II පත්‍රය

පැය 01 විනාඩි 15

විභාග අංකය : ……………………………………………………………………………………………………

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි....**

| | |
|---|---|
| I පත්‍රය ලකුණු | : |
| II පත්‍රය ලකුණු | : |
| මුළු ලකුණු | : |

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

✳ ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.

✳ **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 61 ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.

✳ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

✳ පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.

✳ පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**

# විශේෂ අවධානය පිණිස ...

පාසල්වල විදුහල්පතිවරු පංතිභාර ගුරු මහත්ම/මහත්මීන් වෙත...

- මෙම ප්‍රශ්න පත්‍රය මුද්‍රණයකොට හෝ පිටපත් කර 2022 මැයි මස 20 වන දින හෝ පහසු දිනක ඔබ පාසලේ 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සෑම දරුවෙකුටම ප්‍රශ්න පත්‍රය ලබා දීමට කටයුතු කරන්න.
- ගැටලුවක් ඇතොත් කොට්ඨාසයේ ප්‍රාථමික ගුරු උපදේශක, කලාප විෂය අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශය අමතන්න.
- පිළිතුරු පත්‍රය කලාප කාර්යාලය මගින් ඔබට ලබාගත හැකිය.
- වෙනත් පළාතක, කලාපයක දරුවෙකුට වුවද මෙය ලබාදීමට කටයුතු කරන්න.
- සේ සඳහා ඔබ දක්වන සහයෝගය අගය කරමි.

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන ආකෘතියට අනුව ලකුණු විශ්ලේෂණ වාර්තා සකස් කළ යුතුය.

- 2022 මැයි මස 20 වැනි දින පාසලේදී පිළිතුරු ලිවීම සඳහා

| I පත්‍රය | II පත්‍රය |
|---|---|
| පැය 01 යි | පැය 01 යි මිනිත්තු 15 යි |

- ලකුණු විශ්ලේෂණ වාර්තා අනුව දරුවන් සඳහා ප්‍රතිපෝෂණ සිදුකළ යුතුය.
- මෙදිනට කිරීමට අපහසුවන දරුවන් සඳහා ද මෙය පසු දිනක කළ හැකි බව ද දන්වමි.
- ඉතාමත් සතුටින් හා විනෝදයෙන් මෙම ප්‍රශ්න පත්‍රය ලිවීමට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය**

**01. පහත දැක්වෙන ඡේදය කියවන්න.**

වත්ත පහළ ඇති කැලෑ රොද අපගේ සිත්ගත් තැනක් විය. පාසල් ගොස් නිවසට පැමිණි විට අපි යහළුවන් සමඟ කැලයට ගියෙමු. යහළුවෝ සෑම විට ම එහි යෑමට අපේක්ෂාවෙන් පසු වූහ. කුරුල්ලෝ පලතුරු ගස්වල නිරන්තරයෙන් ගැවසෙති. කුරුල්ලන් නඟන මිහිරි නාදය අප සිත් සතුටු කරවීමට සමත් වෙයි. ඉදුණු මී අඹ පිරී ඇති ගස්වල ගිරවු පදිංචි වී සිටිති.

✷ **ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

1. යාළුවන්ගේ සිත්ගත් තැන කුමක් ද? ..................................................

2. ගිරවු පදිංචි වී සිටින්නේ කොහේ ද? ..................................................

3. ඡේදයේ සඳහන් බහුවචන උක්ත පදයක් ලියන්න? ..................................................

4. ඡේදයේ සඳහන් සඤ්ඤක අක්ෂරයක් ලියන්න. ..................................................

5. කුරුල්<u>ලෝ</u> ඉරි ඇඳි පදයේ පිල්ලම් ලියන්න..................................................

6. **"ගිරවු පදිංචි වී සිටිති."** මෙම වැකිය ඒක වචනයට හරවා ලියන්න.

..................................................

**02. පහත සඳහන් වාක්‍යයේ වචනවල ඇති වැරදි අක්ෂර නිවැරදි කරමින් නැවත ලියන්න.**

කුරුල්ලෝ අහසේ සැරි සරමින් ප්‍රීති ගෝෂා කරන්නට වූයේ කෙතට සෞන්දර්‍ය්‍ය එක් කරමින්.

..................................................

..................................................

**03. පහත සඳහන් වගන්ති ලිඛිත භාෂාවට හරවා ලියන්න.**

1. අක්කා ලස්සන සාරියක් ඇන්දා.

..................................................

2. මම සරුංගල් යවනවා.

..................................................

**04. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වාක්‍යයක් බැගින් ලියන්න.**

1. නාගෙන / එයි / ගෙදරට / අම්මා

..................................................

2. රථ / රුවන් / ගැන / රචනාවක්/ලියයි /වාහන

..................................................

**05. ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

සීයේ ඒ කතාව මොකක් ද

**06. පහත ඉඟිවැකියට ගැළපෙන අදහස ලියන්න.**

අකුරක් නැර - ..................................................

**07.** **පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

1. අශ්වයෝ වේගයෙන් දුවයි. ( )
2. මම වැඩිහිටියන්ට ගරු කරමි. ( )
3. හිරුණි බත් කෑවේ ය. ( )
4. අයියලා, පොත් අතට ගත්හ. ( )

**08.** **පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.**

අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම.

.................................................................................................................

**09.** **පහත සඳහන් යුගල පද අතුරෙන් වඩාත් ගැළපෙන යුගල පද තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

**(තෑගි බෝග , වතු පිටි , අහල පහල , යාන වාහන, ගමන් බිමන්)**

1. පාරේ ........................ තදබදය වාඩිවෙමින් පවතී.
2. බොහෝ ගම්වැසියෝ ........................ වලින් ආදායම් ලබති.

**10.** **පහත සඳහන් වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.**

1. නංගී ඉද්ද මල් කඩයි. - ..........................................................................................


**11.** **සුදුසු ස්ත්‍රී ලිංග නාම පදය ලියන්න.**

1. යහළුවා - ....................................... 2. නළුවා - ..............................................


**12.** **එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.**

1. Rabbit- .............................................. 2. School - ..............................................

13. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනයට අදාළ ඉංග්‍රීසි අකුරු හිස්තැන මත ලියන්න.



| V | e | g | | t | | b | l | e |
|---|---|---|---|---|---|---|---|---|



| F | | s | |
|---|---|---|---|

**14.** **පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.**

1. is / This / house /my. - ......................................................................................
2. am / I / water / drinking. - ......................................................................................


**15.** ''**නණ්බි**'' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

..........................................................................................

16. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

ගුරුතුමා අතන - ..........................................................................................

**17. 1. ගණක රාමුවෙන් නිරූපිත සංඛ්‍යාව අකුරෙන් ලියන්න.**




..........................................................................................................................

2. රවුම් කළ සංඛ්‍යාවේ නිරූපිත අගය ලියන්න.

6 8 (7) 2 - ........................................................................................................

18.


| | |
|---|---|
| 2 | 8 |
| 0 | 3 |

1. කොටුව තුළ ඇති ඉලක්කම් සියල්ලම භාවිතා කර සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව ලියන්න. ..............................................................................................

2. 8242 , 9625 , 8284 , 9065 අවරෝහණ පිළිවෙළට ලියන්න.

..................................................................................................................................................

19.




1. පැන්සලේ දිග කීය ද? ......................................cm


2. 4m 5cm සෙන්ටිමීටර කීය ද? ......................................cm

20. දී ඇති සංඛ්‍යා රටාවල හිස්තැනට ආයුතු සංඛ්‍යාව ලියන්න.

1. 124 , 133 , 142 , 151 , ............................

2. 84 , 91 , 98 , 105 , ............................



21. ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව අකුරෙන් පමණක් ලියන්න.




1. ..........................................................................................................

2. අවුරුද්දට දින 31 ක් ඇති මාස ගණන කීයද?...........................


22. පහත වගුව පුරවන්න.

| **ඝන වස්තුව** | **ඝන වස්තුවේ නම** |
|---|---|
|  | |
|  | |

23. පහත හැඩතලවලට සමමිතික රේඛා කීයක් ඇඳිය හැකි ද? යන්න හිස්තැන මත ලියන්න.

1. 

...................................

2. 

...................................

24. පහත රෝම සංඛ්‍යාංකයට අදාළ පෙර හා පසු සංඛ්‍යාව ලියන්න.

............. V.............

25. අයියාගේ බර 46kg 250g කි. මල්ලීගේ බර 32kg 500g කි. අයියා මල්ලීට වඩා කොපමණ බරින් වැඩි ද? ....................................................................................................................

26. පොල් තෙල් 5 $l$ න් 3 $l$ 250 ml ක් විකුණන ලදී. ඉතිරි පොල්තෙල් ප්‍රමාණය කොපමණ ද?

..........................................................................................................................................

27. එක් කොඩිවැලකට 5 ක් වන සේ කොඩි 649 ක් සෑදිය හැකි.

1. කොඩි වැල් ගණන කීය ද? .....................................................................


2. ඉතිරිවන කොඩි ගණන කීය ද? ..........................................................

28. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | මිල දී ගත් ප්‍රමාණය | **1kg ක මිල** | | **වටිනාකම** | |
|---|---|---|---|---|---|
| | | **රුපියල්** | **ශත** | **රුපියල්** | **ශත** |
| සීනි | 250 g | 124 | 00 | ...................................... | |
| අල | 500 g | ...................................... | | 110 | 00 |
| **මුළු මුදල** | | | | ...................................... | |

2. ඉහත මිල දර්ශනය සඳහා රු. 500.00 ක මුදලක් දුන්නේ නම් ඉතිරි මුදල කීය ද?...................

29. පහත ප්‍රස්තාරයේ සඳහන් වන්නේ පන්තියක සිටින දරුවන් කැමති විෂයන් ය. ඒ අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





1. මව්බස විෂයට කැමති සිසුන් කී දෙනා ද?

..........................................................................

2. චිත්‍ර විෂයට කැමති සිසුන් ගණන 8 කි. එය ප්‍රස්තාරයේ අඳුරු කර දක්වන්න.

30. පහත රූපයෙන් $\frac{1}{2}$ ක් අඳුරු කර දක්වන්න.



2. අඹ ගෙඩි 24 න් $\frac{1}{4}$ ක අඹ ගෙඩි කීය ද? ...............................................................................

- **ප්‍රශ්න අංක 31 සිට 60 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

31. '' මම පාසලට ආලෝකයක් වෙමි.'' මෙය සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ කුමන පියවරට අයත්ද?

1. අධිෂ්ඨානය   2. ප්‍රාර්ථනාව   3. උදානය

32. මහා මාර්ගයේ පයින් ගමන් කිරීමේ දී පිළිපැදිය යුතු කරුණක් වන්නේ,

1. පාරේ දකුණු පැත්තේ අයිනෙන් ගමන් කිරීමයි
2. පාරේ වම් පැත්තෙන් ගමන් කිරීමයි
3. පාරේ මැදින් ගමන් කිරීම

33. වේලාසනින් ආසන වෙන් කරගත හැකි වාහනයකි.

1. ත්‍රිවීල් රථය   2. දුම්රිය   3. ලොරිය


34. පොදු ප්‍රවාහන සේවයේ වාසියක් නොවන්නේ,

1. වියදම අඩුවීම   2. වියදම වැඩිවීම   3. ආරක්ෂිත වීම


35. කප්පි භාවිතා කරන අවස්ථාවක් වන්නේ,

1. වාහනයකට බැරලයක් පැටවීම
2. ගලක් ඇදන් තල්ලුකරගෙන යාම
3. ළිඳකින් වතුර ඇදීම


36. බල්බයක් නොදැල්වෙන අවස්ථාව වන්නේ,



A රූපය



B රූපය



C රූපය

1. A රූපය   2. B රූපය   3. C රූපය

37. අයිස් කැට ප්‍රායෝගිකව යොදා ගන්නා අවස්ථාවක් වන්නේ,

1. මාළු නරක් නොවී තබා ගැනීමට
2. පලතුරු රසවත් කිරීමට
3. පලාවර්ග කල් තබාගැනීමට

38. පස් නියදියක් විනිවිද බෝතලයකට දමා ජලය පිරෙන තෙක් එක්කර හොඳින් සොලවා තබා පැය කිහිපයකට පසුව නිරීක්ෂණය කළ විට පතුලේ තැන්පත් වී ඇත්තේ,

1. හියුමස් කොටස්
2. පස් අංශු
3. බොරලු සහිත ගල්

39. ශ්‍රී ලංකාවේ ලුණු ලේවායක් පිහිටා ඇති පළාතක් වන්නේ,

1. මධ්‍යම පළාත   2. වයඹ පළාත   3. සබරගමුව පළාත

40. කොළ වර්ණය සාදාගැනීම සඳහා සමාන ප්‍රමාණවලින් මිශ්‍රකළ යුතු වර්ණ දෙක මොනවා ද?

1. නිල් සහ කහ   2. නිල් සහ රතු   3. කහ සහ රතු

41. කාල නියමයන් අනුව මල් පිපෙන ශාකයක් හා කාලසීමාවක් නොමැතිව මල් පිපෙන ශාකයක් පිළිවෙළින් සඳහන් පිළිතුර කුමක් ද?

1. පොල් , අඹ  2. එරබදු,කෙසෙල්  3. කෙසෙල්,රඹුටන්

42. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වන්නේ,

1. පාපන්දු  2. ක්‍රිකට්  3. වොලිබෝල්

43. දිමියන් ගොටු සාදාගන්නේ ශාකවල කුමන කොටස්වලින් ද?

1. පත්‍ර වලින්  2. මල්වලින්  3. ගෙඩිවලින්

44. සර්ව භක්ෂක සත්ත්ව කාණ්ඩය තෝරන්න.

1. කුකුළා,බල්ලා,මුවා  2. බල්ලා,බළලා,කුකුළා  3. බළලා,මුවා,ගෝනා

45. පරිසරය පිරිසිදු කිරීම සම්බන්ධව කටයුතු කරන ආයතනයක් වන්නේ,

1. ප්‍රාදේශීය සභාව හා නගර සභාව

2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාව

3. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය හා නගර සභාව


46. ශාකවලින් සතුන්ට සිදුවන යහපත හා සතුන්ගෙන් ශාකවලය සිදුවන යහපත පිළිවෙලින් අඩංගු පිළිතුර කුමක් ද?

1. ආහාර ලබා ගැනීම හා මල්වල පරාගනය

2. පොහොර ලැබීම හා සෙවණ ලැබීම

3. බීජවල විසිරීමට හා ආහාර ලබා ගැනීම

47. පහත දැක්වෙන ලංකා සිතියමේ අංක 01 හා 02 වලින් දැක්වෙන පළාත් වන්නේ,




1. උතුරු මැද පළාත හා ඌව පළාත

2. මධ්‍යම පළාත හා වයඹ පළාත

3. උතුරු මැද හා මධ්‍යම පළාත

48. ''ස්වයං පෝෂිත රටක ඉර හඳ පවත්නා තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාවම වැජඹේවා'' යන සමස්ත අදහස දෙන්නේ,

1. ජාතික කොඩිය  2. ජාතික ගීය  3. රාජ්‍ය ලාංඡනය

49. යෝගට්, කිරි, මුදවපු කිරි වැනි ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී වඩාත් සැලකිලිමත් විය යුතු කරුණ කුමක්ද?

1. ප්‍රමිති ලාංඡනය හා නිෂ්පාදිත දිනය

2. නිෂ්පාදිත දිනය හා කල් ඉකුත් වූ දිනය

3. කල් ඉකුත් වු දිනය හා ප්‍රමිති ලාංඡනය

50. හදිසි අවස්ථාවක දී සුවසැරිය ගිලන් රථය ගෙන්වා ගැනීමට ඇමතිය යුතු දුරකථන අංකය වන්නේ,

1. 1990  2. 1969  3. 1926


51. බිතු සිතුවම් චිත්‍ර සඳහා ප්‍රසිද්ධියක් උසුලන්නේ,

1. ඉසුරුමුණිය  2. සීගිරිය  3. ඇම්බැක්කේ

52. මාශ භෝග ගණයට අයත් වේ,

1. කුරක්කන්  2. මුං ඇට  3. තල

53. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



1. වර්ෂාමානය
2. අනිලමානය
3. සුළං දිශා දර්ශකය

54. ආරක්ෂක ආහාර කාණ්ඩයට අයත්වන ආහාර පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1. කැරට්, නිවිති, ගස්ලබු
2. කජු පුහුලන්, මුහුදු මාළු, පලා වර්ග
3. බත්, කිරි, මස්

55. පස සාරවත් කිරීමට උපකාරි වන සතුන් කාණ්ඩයක් ඇතුළත් පිළිතුර තෝරන්න.


1. බිංකුණ්ඩා ,පණුවා  2. පණුවා, ගැඩවිලා  3. පත්තෑයා,බිංකුණ්ඩා

56. මෙම පින්තූරයේ දැක්වෙන්නේ,



1. ගද්‍ය හා පද්‍ය රචකයෙකි
2. නිදහස් අධ්‍යාපනයේ පියා
3. විද්‍යාඥයෙකු මෙන්ම ලේඛකයෙකි

57. මෙම රූපයෙන් දැක්වෙන්නේ,




1. චුම්බකයකට අල්පෙනෙති ආකර්ෂණය
2. චුම්බකයතට අල්පෙනෙති විකර්ෂණය
3. විද්‍යුත් චුම්බකයක ක්‍රියාකාරිත්වය

58. කාබනික පොහොර වර්ගයක් නොවන්නේ,

1. කොම්පෝස්ට් පොහොර  2. යූරියා  3. ගොම

59. ගෙවතු වගාවේදී භාවිත කරන උපකරණ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1. උදැල්ල , මුල්ලුව , රේක්කය
2. අලවංගුව, ලඹය , උදැල්ල
3. රේක්කය , මයිනහම, උදැල්ල

60. ගෙවත්තක තවානක් සකස් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

1. කාබනික පොහොර එක්රැස් කිරීමට
2. කෙළින්ම පාත්තිවල සිටුවන බීජ ලබා ගැනීමට
3. පාත්තිවල සිටුවීමට පැළ ලබාගැනීමට

61. '' වෙල් යායක අසිරිය'' යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක්ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

1. …………………………………………………………………………………

…………………………………………………………………………………

2. …………………………………………………………………………………

…………………………………………………………………………………

3. …………………………………………………………………………………

…………………………………………………………………………………